# පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ

## කුඹුරුගමුවේ වජිර හිමිපාණන් වහන්සේ

භික්ෂූන්වහන්සේලාගේ අධ්‍යාපන පරිපාටිය සකස් කිරීම සඳහා මෑත භාගයේ දී ගන්නා ලද බොහෝ උත්සාහයන් සිතූ තරම් ප්‍රතිඵලදායක නොවූ බව ප්‍රකට කරුණකි. එම නිසා මේ සම්බන්ධයෙන් ගතයුතු ඵලවත් ක්‍රියාමාර්ගය කවරේ දැයි යළි සලකා බැලීමට අවස්ථාව උද්ගත වී තිබේ. අර්බුදයකට මුහුණ පා සිටින භික්ෂු අධ්‍යාපනයේ මූලික ගැටළු තුනක් ඇත. ඒවා මෙසේය.

1. භික්ෂු සාරූප්‍ය අධ්‍යාපනයක් සංවිධානය කිරීම
2. එම අධ්‍යාපනය ලබා දීමට සුදුසු ආයතන තීරණය කිරීම
3. අධ්‍යාපන ලාභයෙන් පසු භික්ෂූන්වහන්සේ අර්ථවත් කාර්‍ය්‍යයක නිරත කරවීම

මෙතෙක් ඉදිරිපත් කරන්නට යෙදුණු විවිධ යෝජනා ව්‍යර්ථ වූයේ මේ ගැටළුවලින් එකකට හෝ තුනටම ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ඒවායින් ඉදිරිපත් නොවූ නිසා ය.

භික්ෂු අධ්‍යාපනය විධිමත් කිරීම ගැන කල්පනා කිරීමේදී අප විසින් ඒත්තු ගතයුතු සත්‍යතා කිහිපයක් ඇත. ඒවා සැකෙවින් සඳහන් කිරීම යෝජිත මාතෘකාව පිළිබඳ විචාරාත්මක අගැයුමකට බෙහෙවින් අවශ්‍ය ය. පළමුව සිංහල රජදරුවන් දවස භික්ෂූන් වහන්සේ දරා සිටි කාර්‍ය්‍යභාරය අද්‍යතන සමාජය උන්වහන්සේගෙන් අපේක්ෂා නොකරන බව සඳහන් කළ යුතුය. විදේශීය ආක්‍රමණ සහ අපරදිග අධ්‍යාපන ක්‍රමයන්ගේ බලපෑම් නිසා එම කාර්යභාරය ක්‍රමයෙන් ගිහියන් අතට මාරුවී ඇති බව අප විසින් අමතක නොකළ යුතු ය. ඇත්තට ම අද්‍යතන සමාජයේ අධ්‍යාපන නියමුවෝ ගිහියෝය. ඊට හේතුව අද අධ්‍යාපනය නමින් සැලකෙන්නේ ලෞකික අභිමතාර්ථ සාධනයට ඉවහල් වන ක්‍රියාමාර්ගයක් බැවිනි. අනෙකක් තබා පෙරදිග භාෂා හා ආගම් දර්ශනවල ප්‍රවීණත්වය ද අද ගිහියන් අතට පත්වී තිබේ. මෙවැනි යුගයක අධ්‍යාපන කාර්යයෙහි භික්ෂූන් වහන්සේ විසින් ඉටුකළ යුතු කොටස අතිශයින් සීමාසහිත බව අමුතුවෙන් කිවයුතු නැත. දෙවනුව අධ්‍යාපන කාර්යයෙන් භික්ෂූන් වහන්සේලා බලාපොරොත්තු වන දේ හා ගිහියන් බලාපොරොත්තු වන දේ අතර වෙනසක් දක්නට නොලැබෙන ආකාරයට දෙපාර්ශ්වයේ ම අපේක්ෂාව එකක් බවට පැමිණ ඇති බව අප විසින් අමතක නොකළ යුතුය. අධ්‍යාපනය ජීවනෝපායක් සඳහා ය යන ආප්තයේ පිහිටා සිට සියල්ලෝම ක්‍රියා කරති. මේ තත්ත්වයන් යටතේ ගිහි ජනතාව සඳහා ක්‍රියාත්මක කෙරෙන අධ්‍යාපන ක්‍රමයෙන් පරිබාහිර වූ ආධ්‍යාත්මික ජිවන රටාවකට තුඩුදෙන අධ්‍යාපන ක්‍රමයක භික්ෂූන් නිරත කරවීම බෙහෙවින් අසීරුය.

ගිහියා මෙන් භික්ෂූන් වහන්සේ ද ස්වකීය අධ්‍යාපනයේ පරිසමාප්තිය ලෙස දකින්නේ විශ්වවිද්‍යාලය යි. **විශ්වවිද්‍යාලය** ඇත්තේ නියමිත අධ්‍යාපන පාඨ

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

මාලාවක් හැදෑරීමෙන් පසු කෙරෙන පරීක්ෂණයකදී සමත්වන අයට උපාධිය පිරිනැමීමටය. මේ අනුව භික්ෂූන් වහන්සේද උපාධිලාභිත්වය අධ්‍යාපනයේ පරමාර්ථය වශයෙන් ගෙන සිටිති. උපාධිය වෘත්තියාභිමුඛ ක්‍රියාමාර්ගයකි. එහෙයින් උපාධිලාභී භික්ෂූන් වහන්සේ සුදුසු රැකියාවක යෙදීමේ අභිලාශයෙන් පසුවීම අතිශයින් ස්වාභාවිකය. භික්ෂු අධ්‍යාපනය සංවිධානය කිරීමේදී අප අවධානය යොමු කළ යුත්තේ මෙම **ප්‍රවණතාවට ය**.. අප විසින් මුදුන් පැමිණවීමට උත්සාහ දැරිය යුතු වන්නේ මෙම අභිලාශය ය. මීන් පරිබාහිරව කෙරෙන සියළු යෝජනා නිශ්ප්‍රභ වන බව මැන ඉතිහාසයෙන් ඉතා පැහැදිලිය. භික්ෂූන් වහන්සේට සිංහල රජදරුවන් දවස පැවති අධ්‍යාපනය යළි ලබා දෙන්නට උත්සාහ දැරීම අත්‍යන්තයෙන් ම නිෂ්ඵල කාර්යයකි. උන්වහන්සේ බණ භාවනාවට සහ සිංහල, පාලි, සංස්කෘත යන භාෂාවන්ට සීමා කරන්නට උත්සාහ දැරීම දැලින් සුළං බැඳීමට උත්සාහ දැරීම බඳුය. ඉතිහාසය ඉදිරියට මිස පිටුපසට ගලා නොබසී. භික්ෂු ඉතිහාසයට ද මෙම සිද්ධාන්තය එකසේ අදාල වේ. එම නිසා අද්‍යතන යුගයේ ඕනෑඑපාකම් සහ ක්‍රියාකාරකම්ද අවශ්‍යතා හා ප්‍රතිචාර ද තේරුම් ගෙන උන්වහන්සේගේ අධ්‍යාපනය සංවිධානය කළයුතු බවට කිසිදු සැකයක් නැත. මෙම සංවිධානයේ කේන්ද්‍රය විශ්වවිද්‍යාලය වියයුතු බව මගේ හැඟීම ය.

මෙහිදී විශ්වවිද්‍යාලය ගැන වචනයක් කිවයුතුය. සමහරු මෙම වචනය ඇසූ සැණින් බියවෙති. අන්දමන්ද වෙති. එය ශ්‍රමණ සාරූප්‍ය ආයතනයක් නොවේ යයි උද්ඝෝෂණය කරති. එහෙත් විශ්වවිද්‍යාල සංකල්පය තුළ බියකරු ස්වභාවයක් ඇතැයි මටනම් නොසිතේ. අංගසම්පූර්ණ අධ්‍යාපනයක් ප්‍රදානය කළ හැකි එකම ආයතනය ලෙස පිළිගන්නේ විශ්වවිද්‍යාලය යි. එවැනි ආයතනයක් අන් නමකින් හැඳින්වුවද විශ්වවිද්‍යාලයකි. මෙවැනි ආයතන අපේ භික්ෂූන් වහන්සේලාට හොඳට හුරුපුරුදු ඒවාය. ඉන්දියාවට නොගොස් මේ අපේ රටේම පැවති පෞරාණික අධ්‍යාපන ආයතන ගැන සලකන විට විශ්වවිද්‍යාල ගණයේ අධ්‍යාපන ආයතන භික්ෂු ජීවිතය හා බෙහෙවින් සමීප බව පහසුවෙන් තේරුම් ගත හැකිය. අනුරාධපුරයේ මහා විහාරය සහ අභයගිරිය වැනි ආයතන විශ්වවිද්‍යාලය යන නම ලැබීමට සුදුසු ඒවා නොවේ ද? තොටගමුවේ විජයබා පිරිවෙන වැනි පැරණි පරිවේණස්ථාන විශ්වවිද්‍යාලයකට වඩා දෙවැනි වන්නේ කෙසේද? වෙනස ඇත්තේ ආකල්ප විකල්පවලය. ව්‍යූහයේ නොවේ. පෞරාණික ආකල්ප විකල්ප ඒ සැටියෙන් ම අනුගමනය කිරීමෙන් ගැලවීමට අපට හැකිනම් විශ්වවිද්‍යාලය භික්ෂූන්ගේ යහපතට මැනවින් යොද ගතහැකි ආයතනයක් බවට කිසිදු සැකයක් නැත. අද මුළු ලෝකයේ ම, රට සහ ජාතිභේදයෙන් තොරව, ආගම් භේදයෙන් තොරව, ගිහි පැවිදි භේදයෙන් තොරව අධ්‍යාපනයේ පරිසමාප්තිය ලෙස පිළිගැනෙන්නේ විශ්වවිද්‍යාලයයි. එය භික්ෂු අධ්‍යාපනයේද පරිසමාප්තිය ලෙස සැලකීම කාලෝචිතය. එපමණක්ද නොව එමගින් අනවශ්‍ය ගැටළු මතුවීමට ඇති ඉඩකඩ ද ඇහිරී යයි.

භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනය විශ්වවිද්‍යාලයෙන් පරිසමාප්ත වියයුතු යයි මා කරන යෝජනාවේ තේරුම උන්වහන්සේ අනවශ්‍ය ලෙස ලෞකික අධ්‍යාපනයට ගැතිකිරීම යයි සිතාගත යුතු නැත. ඇත්තට ම භික්ෂූන් වහන්සේගේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ශ්‍රමණ සාරූප්‍ය විය යුතුය. මා කථා කරන්නේ කොයි ආකාරයක විශ්වවිද්‍යාල අධ්‍යාපනයක්දැයි මෙහිදී ඇතැමෙකු ප්‍රශ්න කරනු නියතය. මා ඊට දෙන පිළිතුර නම් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පිරිනමන අධ්‍යාපනය මා ඉන් අදහස් කරන බවය. එහිදී බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

ගැන වචනයක් කිවයුතුය. එය භික්ෂූන් සඳහා ම වෙන්වූ විශ්වවිද්‍යාලයකි. මා එසේ කියන්නේ එම විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍ය භාවය භික්ෂූන් වහන්සේට පමණක් උරුම වන හෙයිනි. අභ්‍යන්තරික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ආරාමික පරිසරයක තබා විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් පිරිනැමීමේ අභිප්‍රායෙන් බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ගොඩනඟා ඇත. එය ලංකාවේ හෝ අනෙක් පොදු රාජ්‍ය මණ්ඩලීය රටක හෝ එම නිසා ම ලෝකයේ අනෙක් තැනෙක හෝ ඇති කිසිදු විශ්වවිද්‍යාලයකට දෙවැනි නොවේ. විශ්වවිද්‍යාලය පිහිටුවා සතියක් යන්නට මත්තෙන් පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල පර්ෂදයේ සාමාජිකත්වය එයට පිරිනැමීමෙන් ඒ බව තහවුරු වේ. මෙම විශ්වවිද්‍යාලයේ පාඨමාලා සකස් කොට ඇත්තේ භික්ෂූන් වහන්සේ අරමුණු කොටගෙනය. එම නිසා ලෞකික විද්‍යා, කලා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ උගන්වන්නේ නැත. එහි උගන්වන්නේ සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි යන භාෂාත් විවිධ ආගම් හා දර්ශනත් තදාශ්‍රිත විෂයයන් කිහිපයකුත් පමණකි. මෙම අධ්‍යාපන පරිපාටිය ශ්‍රමණ සාරූප්‍ය නොවේ යයි කිසිවෙකුට කිව නොහැකිය. අනෙක් අතට සාම්ප්‍රදායික ක්‍රමයේ හරයන් උකහාගනිමින් අද්‍යතන යුගයේ ඕනෑඑපාකම් සහ ශිල්පක්‍රම උපයෝගී කරගනිමින් එම විශ්වවිද්‍යාලයේ පාඨමාලා සකස් කොට ඇති බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

සිංහල, පාලි, සංස්කෘත යන පෙරදිග භාෂාත් ඉංග්‍රීසි භාෂාවත් දැන ඉගෙන සාම්ප්‍රදායික ක්‍රමයට බුද්ධ ධර්මය හැදෑරීමෙන් යුගයේ අවශ්‍යතා ඉටු කළ නොහැකිය. අද සියලු විෂයක්ෂේත්‍ර අප නොසිතූ විරූ ආකාරයෙන් එකිනෙකට සමීප වෙමින් පවතී. එක් විෂයක ආභාසය වෙනත් විෂයකට පහසුවෙන් ඇතුල් වේ. එක් චින්තන රටාවක් තවත් චින්තන රටාවක් සසල කරවමින් පැතිර යයි. අන්තර් ආගමික සහජීවනයට මිනිසා සිඝ්‍රයෙන් ඇදී යයි. එම නිසා අන්තර් ආගමික අධ්‍යාපනය කෙරෙහි ද ඔහු උත්සුක වී ඇත. එක් ආගමක් තවත් ආගමකින් ආලෝකය ලැබීමට දිරි දරන යුගයක අද මිනිසා ජීවත්ව සිටී. තාක්ෂණික හා විද්‍යා දියුණුව මගින් නිර්මාණය කරන ලද අතිශයින් සංකීර්ණ වූ ලෝකයක ඔහු අතරමංව සිටී. මේ තත්ත්වයන් යටතේ බුදුදහම ඉගෙන ගතයුතු ආකාරයත් ඉගැන්විය යුතු ආකාරයත් පිළිබඳ විප්ලවීය වෙනස්කම් සිදු කළ යුතු කාලයක අප ජීවත්ව සිටිමු. භික්ෂූන් වහන්සේට මෙකී අභියෝගයනට මුහුණ දියහැකි පරිද්දෙන් බුදුදහම ඉගැන්වීමේ කාර්යභාරයට බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය අත දී සිටී. එහි පාඨමාලා හදාරණ භික්ෂූන් වහන්සේලා ඉගෙන ගන්නේ ප්‍රාචීන භාෂා හා ප්‍රතිචීන භාෂා පමණක් නොවේ. බුදුන්වහන්සේගේ පණිවුඩය කාලවාදීව විද්‍යානුකූලව ඉදිරිපත් කිරීමට අවශ්‍ය සමයාන්තර දැනුම ද සමාජ විද්‍යානුකූල ශික්ෂණය ද නූතන චින්තන රටා පිළිබඳ ප්‍රවීණත්වය ද බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය මගින් උන්වහන්සේලාට ප්‍රදානය කෙරේ. සැකෙවින් පවසතොත් පෙර අපර දෙදිග සාරධර්ම සහ අධ්‍යාපන ක්‍රම තුලනය කොට නිමවන ලද භික්ෂූන් වහන්සේ වෙනුවෙන් ම කැප වූ අනෙක් මෙබඳු ආයතනයක් තවත් නැත.

එම නිසා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පරිපාටිය භික්ෂු අධ්‍යාපනයේ පරිසමාප්තිය ලෙස පිළිගැනීමට මා කරන යෝජනාව ගැන කිසිවෙක් උරණ නොවෙතියි මම විශ්වාස කරමි. ඉහත සඳහන් කරන ලද ගැටළු තුනෙන් දෙකකට පිළිතුරු බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් දැනටමත් පිරිනමා හමාර බව මෙහි දී සඳහන් කළ යුතු ය.


ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය භික්‍ෂු අධ්‍යාපනයේ පරිසමාප්තිය නම් ඉන් මෙපිට භික්ෂූන් වහන්සේ වෙනුවෙන් දිය යුතු අධ්‍යාපනය ද ඊට අනුලෝම වන පරිදි සකස් විය යුතුය. එසේ නම් පිරිවෙන් අධ්‍යාපනය එහි අග්‍රඵලය බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ලෙස සලකා ගෙන සංවිධානය කළ යුතුය. මෙය ඉතා පහසු කාර්‍යයකි. ඒ පිළිබඳ දළ සැලැස්මක් ඉදිරිපත් කිරීමට මම මෙහිදී බලාපොරොත්තු වෙමි. ඊට ප්‍රථම බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ව්‍යුහය ගැන වචනයක් කිව යුතුය.

බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය නමින් ඇත්තටම ගැනෙන්නේ කාර්යාල උපස්ථිථියකි. එය දනට පිහිටා ඇත්තේ කොළඹ බෞද්ධාලෝක මාවතේය. පාඨමාලා සංවිධානය කිරීම, පරීක්‍ෂණ පැවැත්වීම සහ විශ්වවිද්‍යාලය පරිපාලනය යන කරුණු සිදු කරන්නේ මහොපාධ්‍යායයන් වහන්සේ කෙනෙකුගේ මූලිකත්ව-යෙන් පවත්නා එම කාර්යාලයීය උපස්ථිථියෙනි. විශ්වවිද්‍යාලය හා අනුබද්ධ අධ්‍යයන කටයුතු සිදු කෙරෙන්නේ දිවයිනේ ප්‍රදේශ හතරක පිහිටුවා ඇති ආයතන හතරක් මගිනි. එම ආයතනවල සියලු අවශ්‍යතා ඉටුකිරීමට විශ්වවිද්‍යාලය නීතියෙන් බැඳී සිටී. ශිෂ්‍යයන් ලියාපදිංචි කරනු ලබන්නේ ආයතනවලට අනුබද්ධ කොටය. ආයතනික ශිෂ්‍යයෝ නේවාසික පහසුකම්වලට හිමියෝය. සිවුපසයෙන් උන්වහන්සේලාට සංග්‍රහ කිරීමේ වගකීම එක් එක් ආයතනය උසුලයි. මේ අනුව බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල ව්‍යුහයේ මූලික අවස්ථා දෙකක් ඇති බව පැහැදිලිය. ඉන් මුල් අවස්ථාව විශ්වවිද්‍යාලය යනුවෙන් ද දෙවන අවස්ථාව ආයතනික පිරිවෙන් යනුවෙන් ද මම මෙහිදී හඳුන්වමි. මෙකී ව්‍යුහයට පිරිවෙන් අධ්‍යාපනය ඇඳෙන්නේ කෙසේදැයි මම මෙතැන් සිට සැකෙවින් පැහැදිලි කරමි.

පිරිවෙන් වර්ග දෙකක් තුළ පිරිවෙන් අධ්‍යාපනය සංවිධානය කළ හැකිය. ඉන් එකක් මූලික පිරිවෙන නමින් ද අනික මහ පිරිවෙන නමින් ද හැඳින්විය හැකිය. මූලික පිරිවෙනේ අධ්‍යාපනය ශ්‍රේණි පහකට සීමා කළ යුතුය. පස්වෙනි ශ්‍රේණිය අවසානයේදී මූලික පිරිවෙන් විභාගය පැවැත්වේ. එම විභාගයෙන් සමත් වන භික්ෂූන් වහන්සේලා මහ පිරිවෙනට ප්‍රවේශ වෙති. මහ පිරිවෙනේ අධ්‍යාපනය ශ්‍රේණි හතකින් සමන්විත විය යුතුය. මූලික පිරිවෙනේ ක්‍රියාත්මක වන ශ්‍රේණි පහට අමතරව තවත් උසස් ශ්‍රේණි දෙකක් මහ පිරිවෙනේ පවත්වනු ලැබේ. එම ශ්‍රේණි දෙකින් කරනු ලබන කාර්‍යය සමාන වන්නේ පාසලක අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ ශ්‍රේණිවලින් ඉටුකරනු ලබන කාර්‍යයටය. අධ්‍යාපන දිස්ත්‍රික්කයක් තුළ ඕනෑම ගණනක් මූලික පිරිවෙන් තිබිය හැකිය. එහෙත් මහ පිරිවෙන් තිබිය හැක්කේ එකක් හෝ දෙකක් පමණි. මහ පිරිවෙනේ හයවෙනි හා හත්වෙනි ශ්‍රේණිවල අධ්‍යාපනය සම්පූර්ණ කරන භික්ෂූන් වහන්සේ වෙනුවෙන් ප්‍රවේශ පරීක්‍ෂණයක් බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය මගින් පැවැත්විය යුතු යයි මම යෝජනා කරමි. ඉන් සමත් වන භික්ෂූන් වහන්සේලා ආයතනික පිරිවෙනකට ඇතුළුව බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පාඨමාලා හදරති. සාර්ථක ලෙස එම පාඨමාලා හදරන අයට ශාස්ත්‍රවේදී උපාධිය පිරිනමනු ලැබේ. ඉහත කළ යෝජනාව පහත දැක්වෙන ආකාරයෙන් සම්පිණ්ඩනය කොට දැක්විය හැකිය.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk





මූලික පිරිවෙන් මහ පිරිවෙන් සහ ආයතනික පිරිවෙන් යනු විසින් වර්ග කෙරෙන මුළු මහත් පිරිවෙන් පද්ධතියේ ම පරමාර්ථය බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයට අවශ්‍ය ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ පුහුණු කිරීම බව මින් පැහැදිලිය. මෙම ශික්ෂණයේදී එක් එක් පිරිවෙන් ගණයක මූලිකත්වය දියයුතු විෂයක්ෂෙත්‍ර ගැන ද මෙහි දී සැකෙවින් යමක් සඳහන් කළ යුතුය. ආයතනික පිරිවෙන් වල උගන්වනු ලබන බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පාඨමාලා බෙහෙවින් විස්තීරණ බවත් ගැඹුරු බවත් ඔබ දන්නවා ඇත. එම පාඨමාලා සාර්ථක ලෙස අනුගමනය කිරීමට නම් ප්‍රබල පසුබිමක් භික්ෂූන් වහන්සේට තිබිය යුතුය. මූලික පිරිවෙන් සහ මහ පිරිවෙන් මගින් කළයුතු වන්නේ මෙම පසුබිම සකස් කිරීමය. මූලික පිරිවෙනක ඇති ශ්‍රේණි පහ තුළ එක් එක් ශ්‍රේණියට අනුරූප වන පරිද්දෙන් පහත දැක්වෙන විෂයයන් යටතේ නව පාඨමාලා සකස් කළ යුතුය. එම විෂයයන් නම් සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි, බුද්ධධර්මය, ගණිතය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සිංහල සාහිත්‍යය, විද්‍යාව, ප්‍රජාචාරය යි. **මහ පිරිවෙණේ** හයවෙනි හා හත්වෙනි ශ්‍රේණිවල ඉගෙනුම ලබන භික්ෂූන් වහන්සේට පාලි සහ බුද්ධධර්මය අනිවාර්ය විෂයයක් වේ. ඊට අමතරව උන්වහන්සේ සිංහල, සංස්කෘත, බෞද්ධ සංස්කෘතිය, දර්ශනය, සමාජ විද්‍යාව, ආගම් තුලනය, බෞද්ධ කලා ශිල්ප යන විෂයයන්ගෙන් දෙකකට ප්‍රවේශ පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුය. එක් එක් විෂයය පැය තුනේ ප්‍රශ්න පත්‍ර දෙකකින් පරිමිත වේ. මූලික පිරිවෙන් සහ මහ පිරිවෙන් සඳහා මෙහි නම් කළ විෂයක්ෂෙත්‍ර ඒ ආකාරයෙන් ම පිළිගත යුතුයයි මම නොකියමි. විෂයය වර්ගීකරණය මීටත් වඩා විධිමත් ලෙස ඉදිරිපත් කිරීමට යථා කාලයේදී හැකිවෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

ඉහත නම් කළ ගැටළු තුනෙන් තුන්වැන්න ගැන මෙහිදී යමක් කිව යුතුය. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලැබ සමාජයට පිවිසෙන භික්ෂූන් වහන්සේ සමාජගත කවර කාර්යයක උපයුක්ත කරනවාද යන ප්‍රශ්නය මෙහිදී

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

නිතැතින්ම පැන නගී. එම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම එතරම් දුෂ්කර නොවේ. මක්නිසාද යත් අධ්‍යාපන අමාත්‍යාංශයත්, බුද්ධශාසන අමාත්‍යාංශයත් එම භික්ෂූන් වහන්සේලාගේ උපයෝගීතාව දැනටමත් හඳුනාගෙන ඇති බැවිනි, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් සමාජගත වන සියළු උපාධිධාරී භික්ෂූන් වහන්සේලාට රජයේ **පාසල්වල** ධර්මාචාර්ය පදවි පිරිනැමීමට එම අමාත්‍යාංශය සැදී පැහැදී සිටී. මෙවැනි සහතිකයක් ජාතික **විශ්වවිද්‍යාලයවලින්** පිටවන භික්ෂූන් වෙනුවෙන් මෙතෙක් ලැබී නැත. මේ ආකාරයෙන් සලකන විට මවිසින් ඉහත ඉදිරිපත් කරන ලද භික්ෂු අධ්‍යාපනය සම්බන්ධ ගැටලු තුනටම පිළිතුරු බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ඔස්සේ ලබාගත හැකි බව ඉතා පැහැදිලිය. මුළු මහත් වැඩපිළිවෙල පහත දක්වෙන සේ සම්පිණ්ඩනය කළ හැකිය.




මාගේ මේ යෝජනාව අසන කියවන බොහෝ දෙනා තුළ අනිවාර්යයෙන් පැන නඟින ගැටළු දෙකක් ඇත. ඉන් එකක් නම් දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා ප්‍රාචීන පණ්ඩිත උපාධියෙන් කෙළවර වන අධ්‍යාපන ක්‍රමය කොයිබටද යන්න යි. අනෙක නම් ලෞකික අධ්‍යාපනයට මුල් තැන දෙන ජාතික විශ්ව විද්‍යාලයනට භික්ෂූන් වහන්සේ ප්‍රවේශ වීම පිළිබඳ ගැටළුවයි. මගේ යෝජනාව තුළ කිසිවකුට තහංචි පැනවීමක් නැත. කැමති කෙනකුට මනාප පරිද්දෙන් ප්‍රාචීන පණ්ඩිත උපාධිය ලබා ගැනීම සඳහා උත්සාහ කිරීමටත් ලෞකික විෂයක්ෂෙත්‍ර හැදෑරීමට ජාතික විශ්වවිද්‍යාලයකට ප්‍රවේශ වීමටත් ඉඩකඩ ඇත.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk